**ශීර්ෂය - 258 මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021දෙසැම්බර් 31දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 25 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුනි 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාවේ මා විසින් කර තිබුණු නිර්දේශය ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 2021/03 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණද, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.1 ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශවලට අමුණා තිබිය යුතු SA-10, SA-50, SA-71, SA-81 හා SA-90 ආකෘති මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | විගණනයෙන් දක්වා තිබූ ගිණුම් ප්‍රකාශන ඇතුළත් කිරීම මග හැරී තිබූ බවත්, ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී එම අඩුපාඩු මඟහරවා ගැනීමට පියවර ගන්නා බවත් දක්වා ඇත. | චක්‍රලේඛ විධිවිධාන අනුව නියම කර ඇති තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 ඡේදයට අනුව දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අනුව ශේෂ සමඟ එකඟ වන බවට සහතික වී තිබුණද, භාණ්ඩාගාර පොත් අනුව හා දෙපාර්තමේන්තු පොත් අනුව ආදායම අතර රු.113,170,000 ක වෙනසක් හා වියදම් ශේෂය අතර රු.113,170,000 ක වෙනසක් පැවතුණි. | දෙපාර්තමේන්තුව දෛනික මූල්‍ය ගණුදෙනු සිගාස් (Cigas) පරිගණක වැඩසටහන මඟින් වාර්තා කර මාසිකව ගිණුම් සාරාංශ මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරයි. එහිදී කිසිදු විටෙක ආදායම් අඩුවෙන් වාර්තා කිරීමක් සිදුකර නොමැත. | නිවැරදිව ගිණුම් ගත කිරීම් කර ශේෂ පිරික්සුම භාණ්ඩාගාර පොත් සමඟ ගැලපීම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ සංග්‍රහයේ 6 ඡේදය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේ දී මුදල් හා හරස් සටහන් යන දෙකම සැලකිල්ලට ගත යුතුය. ඒ අනුව දෙපාර්තමේන්තු පොත් අනුව අත්තිකාරම් ලැබීම් රු.126,697,544 ක් වුවද, එය රු.113,655,870 ක් ලෙස රු.13,041,674 ක් අඩුවෙන් ද, අත්තිකාරම් ගෙවීම් රු.110,573,811 ක් වුවද, එය රු.97,532,137 ක් ලෙස රු.13,041,674 ක් අඩුවෙන් ද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අත්තිකාරම් ගෙවීම් ලෙස රු.97,532,137 ක වටිනාකම සටහන් කර ඇත්තේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ 258 වැය ශීර්ෂය සහ වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් මුදල් ප්‍රවාහය තුල සත්‍ය වශයෙන් කරන ලද මුදල් ගෙවීම්ය. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අත්තිකාරම් අයකර ගැනීම් ලෙස රු.113,655,870 ක වටිනාකම සටහන් කර ඇත්තේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ 258 වැය ශීර්ෂය සහ වෙනත් වැය ශීර්ෂ වලින් මුදල් ප්‍රවාහය තුළට සත්‍ය වශයෙන් ලැබූ මුළු මුදල් ප්‍රමාණයයි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ සංග්‍රහය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය. |
| (ඈ) | වෙනත් අමාත්‍යාංශ මඟින් (මූලධන වත්කම්, පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම සහ හැකියා වර්ධනය හැර) අනෙකුත් මූලධන වියදම් වෙනුවෙන් දරන ලද රු.1,680,409,158 ක වියදම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු වුවද, මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම ලෙස දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීම සඳහා හඳුන්වා දී ඇති ආකෘතියේ “වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් ” යනුවෙන් අයිතමයක් වෙනම පවතින නිසා ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුත්තේ 258 වැය ශීර්ෂයේ ප්‍රාග්ධන වියදම් වලින් එකතුවන, ආයෝජන ක්‍රියාකාරකම් බව පෙන්වා දෙමි. | මෙම මූලධන වියදම් ආයතනයේ වත්කම් ලෙස ගැනෙන අතර, මෙවා ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතුය. |

## 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ආදායම් නොවන ලැබීම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළව ආදායම් නොවන ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| වී මිලදී ගැනීමට භාණ්ඩාගාරයෙන් ලබාදුන් ණය, අත්තිකාරම් කටයුත්තක් බැවින් (සංකේතය - 7000) ඉන් අයකරන ලද වාරික | ඉදිරි වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේ දී විගණනයෙන් පෙන්වා දී ඇති ආකාරයට මූල්‍ය | මෙම මුදල් අත්තිකාරම් වැය විෂය යටතේ ලද මුදල් බැවින්, ලබාදුන් ණය |

| | | |
|---|---|---|
| මුදල වූ රු.300,000 ක් අත්තිකාරම් ලැබීම් යටතේ ගිණුම්ගත කළ යුතු වුවද, ආදායම් නොවන ලැබීම් යටතේ වෙනමම සටහන් කර තිබුණි. එසේම ලැබිය යුතු අත්තිකාරම් මුදල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ද දක්වා නොතිබුණි. | කාර්යසාධන ප්‍රකාශයේ සටහන් කිරීමට පියවර ගන්නා බව දන්වමි. | මුදල පියවීමට අයකරන ලද වාරිකයද අත්තිකාරම් යටතේ ගිණුම්ගත කළ යුතුය. |

(ආ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් පිළිබඳව වූ සැසඳුම් ප්‍රකාශය
--------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ------------------------ | ---------------- |
| (i) | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ සංග්‍රහය අනුව මූල්‍ය ප්‍රකාශන භාණ්ඩාගාර මුද්‍රිත සටහන්වල ශේෂ පදනම් කරගෙන පිළියෙල කළ යුතු වුවද, හරස් සටහන් මඟින් අත්තිකාරම් ලැබීම් හා අත්තිකාරම් ගෙවීම් ගැලපීමෙන් පසු ශේෂය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දැක්වීම හේතුවෙන් ලැබීම් රු.747,966 ක් හා ගෙවීම් රු.11,110,304 ක් අඩුවෙන් දක්වා තිබුණි. | දෙපාර්තමේන්තු ගිණුම් ඒකකයේ සිගාස් (Cigas) පරිගණක වැඩසටහන මඟින් උත්පාදනය වන ශේෂ පිරික්සුම පදනම් කරගෙන සිදුකරන ලෙස මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් ලබාදුන් අවසන් ගිණුම් පිළියෙල කිරීමේ පුහුණුවේදී උපදෙස් දුන් අතර, ඒ අනුව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයයේ ලැබීම් හා ගෙවීම් සටහන් කළ බව පෙන්වා දෙමි. | මාර්ගෝපදේශ සංග්‍රහය අනුව භාණ්ඩාගාර ශේෂ පදනම්ව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ii) | මූල්‍ය ප්‍රකාශනවල සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කිරීමේදී පෙර වර්ෂයේ අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් පිළිවෙළින් රු.2,765,912 ක් හා රු.12,619,345 ක් වැඩියෙන් දක්වා තිබුණි. | විගණනයෙන් පෙන්වා දුන් ආකාරයට අත්තිකාරම් ලැබීම් රු.72,305,129 ක් ලෙස හා ගෙවීම් රු.67,695,209 ක් ලෙස ඇතුළත් කළ 2020 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ පිටපතක් ඇමුණුම 03 වශයෙන් එවා ඇති බව, | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී නිවැරදි අගයන් සංසන්දනාත්මක තොරතුරුවල ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | ඉකුත් වර්ෂයට අදාළ ස්ථාන මාරු වී ගිය සහ ස්ථාන මාරු වී පැමිණි රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් පිළිවෙළින් රු.34,283,496 ක් හා රු.53,270,928 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කිරීමේ දී එම අගයන් පිළිවෙළින් රු.46,770,074 ක් හා රු.55,906,988 ක් ලෙස දක්වා තිබුණි. මේ හේතුවෙන් ඉකුත් වර්ෂයට අදාළ අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් පිළිවෙළින් රු.12,486,578 ක් හා රු.2,636,060 ක් වැඩියෙන් දක්වා තිබුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති ආකාරයට 2020 වර්ෂයේදී වාර්තා කරන ආයතනයෙන් පිටතට මාරුකිරීම් වලදී පවරා දුන් ණය ලෙස රු.34,140,961 සහ ආයතනය වෙත මාරු වී පැමිණෙන නිලධාරීන් වෙනුවෙන් පවරාගත් ණය මුදල් වටිනාකම ලෙස රු.45,185,548 යන වටිනාකම් ඇතුළත් කර නැවත සකස් කරන ලද 2020 අග්‍රිම සැසඳුම් ප්‍රකාශය ඇමුණුම 02 වශයෙන් අංක KDS/2/4/2/1 දරන පිළිතුර සමඟ අමුණා එවා ඇත. | ඉකුත් වර්ෂයට අදාළව සංසන්දනාත්මක තොරතුරු දැක්වීමේදී නිවැරදි අගයන් දැක්විය. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තු පොත් අනුව වෙනත් ආයතන වෙත මාරු වූ නිලධාරින් වෙනුවෙන් පවරාදුන් ණය හා වෙනත් ආයතන වෙතින් මාරු වී පැමිණි නිලධාරින් වෙනුවෙන් පවරාගත් ණය ශේෂ පිළිවෙළින් රු.36,439,248 ක් හා රු.55,643,387 ක් වුවද, එම අගයන් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ රු.47,549,552 ක් හා රු.56,391,352 ක් ලෙස දක්වා තිබුණි. ඒ හේතුවෙන් පවරාදුන් හා පවරාගත් ණය ශේෂ අතර පිළිවෙළින් රු.11,110,304 ක හා රු.747,965 ක වෙනසක් පැවතුණි. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය පිළියෙල කිරීම දෙපාර්තමේන්තුවේ Cigas පරිගණක වැඩසටහනෙන් උත්පාදනය වන ශේෂ පිරික්සුම පදනම් කරගෙන සිදු කරන ලෙස මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව ලබාදුන් උපදෙස් අනුව සිදුකළ බව. | නිවැරදි ශේෂ දක්වා සැසඳුම් ප්‍රකාශ පිළියෙල කළ යුතුය. |

**(ඇ) දේපල පිරියත හා උපකරණ**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මූල්‍ය නොවන වත්කම්වල ඉකුත් වර්ෂයේ අවසාන ශේෂය රු.6,535,339,049 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ ආරම්භයේ දී එම ශේෂය රු.6,611,958,391 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් රු.76,619,342 ක් වැඩියෙන් දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා SA 82 භාණ්ඩාගාර සටහන දෙපාර්තමේන්තුව විසින් මුද්‍රණය කර ලබාගෙන ඇත්තේ 2022.02.11 දින වන අතර 2020.12.31 දින සිට 2022.02.11 දින දක්වා මූල්‍ය නොවන වත්කම් තක්සේරුකර ගිණුම්ගත කිරීම්, ගිණුම් ගැළපීම් වැනි කරුණු ගිණුම්ගත කිරීමේදි ඒවා ආරම්භක ශේෂයට එකතුවී ඇත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි අගයන් ගත යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් විෂයයන් 03 ක අගය මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු භාණ්ඩාගාර සටහන් අනුව රු.8,572,983 ක් හා විගණන අවස්ථාවේ දී භාණ්ඩාගාර දත්ත පද්ධතියෙන් ලබාගත් තොරතුරු අනුව රු.7,810,337 වූ බැවින් රු.762,646 ක වෙනසක් පැවතුණි. මෙම වෙනසට අදාළ තොරතුරු ද විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | SA 82 භාණ්ඩාගාර සටහන දෙපාර්තමේන්තුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා මුද්‍රණය කරගෙන ලබාගෙන ඇත්තේ 2022.02.11 දින වීමත් විගණනය විසින් විගණන කටයුතු සඳහා භාණ්ඩාගාර සටහන මුද්‍රණය කරගෙන ලබාගෙන ඇත්තේ 2022.03.30 දින වීමත් නිසාය. ඒ අනුව, පෙබරවාරි 11 සහ මාර්තු 30 යන කාලය තුළ දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලද ගිණුම් සටහන් හේතුවෙන් මෙම වෙනස පැන නැගී ඇත. | -එම- |

| | | | |
|---|---|---|---|
| (iii) | වැය විෂය අංක 2102 ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ, 2103 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ සහ 2104 ගොඩනැගිලි හා ඉදිකිරීම් අත්පත් කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී දරා තිබුණු මූලධන වියදම රු.113,695,902 ක් වුවද, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ එම අගය රු.33,928,200 ක් වූයෙන් රු.79,767,702 ක වෙනසක් පැවතුණි. | වර්ෂය තුළ දරන ලද මූලධන වියදම් සියල්ල අත්පත් කර ගැනීම් ලෙස හෝ ආරම්භක ශේෂයට එකතු කිරීම් ලෙස සටහන් වන බැවින් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයට වත්කම් නිවැරදිව ගිණුම්ගත වන බව දක්වා ඇත. | වෙනස්කම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් නිවැරදිව සිදු කළ යුතුය. |
| (iv) | මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20 ක් ඉදිරිපත් කර තිබුණු වත්කම් වාර්තා සැසඳීමේ දී වත්කම් විෂයයන් 03 කට අදාළව රු.21,321,307 ක වෙනස්කම් පැවතුණි. | SA 82 භාණ්ඩාගාර සටහන මුද්‍රණය කර ගෙන ඇත්තේ 2022.02.11 දින වන අතර, කාර්යාල විසින් Asset Report පිළියෙල කිරීම සඳහා Asset Category Report මුද්‍රණය කර ගෙන ඇත්තේ කාර්යාල විසින් විවිධ දිනවලදිය. මේ හේතුවෙන් SA 82 භාණ්ඩාගාර සටහනේ සහ Asset Report හි වෙනස්කම් පවතින බව දක්වා ඇත. | නිවැරදි අගයන් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

**(ඇ) අග්‍රිම ශේෂය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තු පොත් අනුව වෙනත් මූලාශ්‍රවලින් ලද ලැබීම්වල ශේෂ එකතුව රු.846,675,062 ක් වුවද, එය අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශයෙහි රු.959,845,062 ක් ලෙසට දැක්වීම හේතුවෙන් රු.113,170,000 ක වෙනසක් පැවතුණි. | දෙපාර්තමේන්තුවට 2021 වර්ෂය තුළ වෙනත් මූලාශ්‍රවලින් ලද ලැබීම්වල එකතුව රු.959,845,062 ක් බව දක්වා ඇත. | වෙනස්කම් පිළිබඳ සොයාබලා නිවැරදි තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

-------------------------

### 2.1 වියදම් කළමනාකරණය

---------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | --------------------------- | ---------------- |
| නිසි අධ්‍යයනයකින් තොරව ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් වැය විෂයයන් 11 ක් සඳහා සලසා තිබුණු මූල්‍ය ප්‍රතිපාදනවලින් රු.100,000 සිට රු.3,406,864 ක් හෙවත් ප්‍රතිපාදන මුදලින් සියයට 15 සිට සියයට 100 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. | දෙපාර්තමේන්තුව විසින් 2020 වර්ෂයේදි 2021 වර්ෂය වෙනුවෙන් ඇස්තමේන්තුකල ද වියදම් සිදුනොකර මුදල් ඉතිරි කරන ලද්දේ ඒ වන විට මේ දක්වා රටේ පැවති සහ පවතින අයහපත් මූල්‍ය තත්වය පිළිබඳව විචක්ෂණශිලි අවබෝධයකින් කටයුතු කිරිම නිසා බව දන්වමි. | ඇස්තමේන්තු සකස් කිරීමේදී නිවැරදිව ඇස්තමේන්තු කිරීමත්, මුදල් උපරිම කාර්යක්ෂම හා ඵලදායීව උපයෝජනය කිරීමක් කළ යුතුය. |

### 2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

-----------------------------------------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | --------------------------- | ---------------- |
| ග්‍රාමීය මාර්ග හා යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය මඟින් ග්‍රාමීය මාර්ග 53 ක් සංවර්ධනය කිරීම සඳහා රු.39,600,000 ක මූල්‍ය ප්‍රතිපාදන ලබා දී තිබුණ ද, එම ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි. | ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම සඳහා නිකුත් කර තිබුණු උපදෙස් හා චක්‍රලේඛවල පැවති සංකීර්ණත්වය හා ප්‍රායෝගික නොවීම හේතුවෙන් ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සිදු වී නොමැති බව දක්වා ඇත. | ප්‍රතිපාදන මුදල් උපරිම කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කළ යුතුය. |

**2 .3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දිමේ නිලධාරි විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| | නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| **(i)** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයෙහි 4.6 වගන්තිය | 2011 පෙබරවාරි සිට 2020 අගෝස්තු දක්වා කාල පරිච්ඡේදය තුළ වැඩ තහනම් කර ඇති හා සේවය අතහැර ගිය නිලධාරීන් 05 දෙනෙකුගෙන් අයවිය යුතු ණය අයකරගෙන නොතිබුණි. | මෙම නිලධරයන් වර්ෂ 10 ක සේවා කාලය සම්පූර්ණ කර ඇති අය නිසා ඇපකරුවන්ගේ අවශ්‍යතාවයක් නොමැති බැවින් ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට නොහැක. | ආයතන සංග්‍රහයේ නියමයන් අනුව කටයුතු කළ යුතුය. |

**2.5 තැන්පතු ශේෂයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පූජාපිටිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ඉකුත් වර්ෂයේදී ඉදිකිරීම් සිදුකළ ව්‍යාපෘති 210 ක, රු.117,144,796 ක රැඳවුම් මුදල් පැවති අතර, රැඳවුම් කාලය ඉකුත්ව තිබුණි. ව්‍යාපෘතිවල පවතින අඩුපාඩු සකස් නොකිරීම හේතුවෙන් මෙම රැඳවුම් මුදල් නිරවුල් කර නොතිබුණු අතර, එම අඩුපාඩු කොන්ත්‍රාත්කරුවන් ලවා ඉටු කරවා ගැනීමට හෝ මෙම රැඳවුම් මුදල් උපයෝගී කරගෙන අදාළ අඩුපාඩු නිවැරදි කර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. | අග්‍රිම නොමැති වීම නිසා ගෙවීම් කිරීමට නොහැකි වී ඇති බවත්, කල් ඉකුත් වූ රැඳවුම් නොමැති බව දක්වා ඇත. | ව්‍යාපෘතිවල අඩුපාඩු සකස් කර ගැනීමට ක්‍රියා කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලයේ වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල මඟින් හතරලියද්ද ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශයේ පිහිටි ජොෂ්ඨ පුරවැසි නිවාසය අලුත්වැඩියා කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ ලබාදී තිබුණු රු.940,000 ක මුදල අදාළ කාර්යය සඳහා උපයෝගී නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | ලබාදුන් ප්‍රතිපාදන මුදලින් ආරක්ෂිත වැට ඉදි කිරීම හා නාන කාමර අලුත්වැඩියාවට අදාළ මූලික කටයුතු ආරම්භ කිරීම වෙනුවෙන් රු.260,000 ක මුදලක් වැය වී ඇති බවත්, රටේ උද්ගත වූ ආර්ථික අර්බුධකාරී තත්ත්වය හේතු කොට ගෙන ඉදිරි වැඩ නිම කිරීමට අපහසු තත්ත්වයකට පත්ව ඇත. | සංවර්ධන ව්‍යාපෘති සඳහා ලැබෙන ප්‍රතිපාදන අපේක්ෂිත අරමුණු කරා යෙදවීමට හැකිවන පරිදි උපරිම කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනයට ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ මාර්ග 187 ක් සංවර්ධනය කිරීම සඳහා රු.127,161,000 ක ප්‍රතිපාදන අනුමත කරගෙන තිබුණ ද, ව්‍යාපෘති කිසිවක් ක්‍රියාත්මක කර නොතිබුණි. | ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කර තිබූ උපදෙස් හා චක්‍රලේඛවල පැවති සංකීර්ණත්වය හේතුවෙන් ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ප්‍රාදේශීය ලේකම්වරුන්ට සහ සෙසු නිලධාරීන්ට ගැටළු සහගත විය. එම නිසා මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක නොවූ අතර, ඒ අනුව එම ප්‍රතිපාදන ආපසු පවරාදීම සිදු වී ඇති බව දක්වා ඇත. | ග්‍රාමීය මාර්ග සංවර්ධනය කර ජනතාවගේ අවශ්‍යතා සපුරාලීමට ක්‍රියා කළ යුතුය. |

## 3.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් වර්ෂයේ රු.990,000 ක පිරිවැයක් දරා කුණ්ඩසාලේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ඉදිකළ ගල්පිහිල්ල කෘෂි අලෙවි මධ්‍යස්ථානය හා ගල්පිහිල්ල වසම සේවා පියස උඩුමහල සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් භාවිතයට ගෙන නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | නිමකළ ව්‍යාපෘති උපයෝජනය කළ යුතුය |

## 3.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හාරිස්පත්තුව ප්‍රාදේශිය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ ගිවිසුම්ගත වටිනාකම රු.1,975,000 ක කුළුගම්මන පිටවෙල ඇළ මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය 2021 දෙසැම්බර් 31 දින වන විට නිම කළ යුතුව තිබුණි. 2022 පෙබරවාරි 10 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී මීටර් 24.3 ක් දිග වැඩ වටිනාකම වූ රු.386,991 ක ඇළ මාර්ග | කොත්මලේ ජාත්‍යන්තර වාරිමාර්ග පුහුණු ආයතනයේ නිළධාරීන්ගේ ද උපදෙස් පරිදි ව්‍යාපෘතියේ ඉදිකිරීම් ආරම්භ කර ඉතිරි කොටස් අවිච්ඡේද කරන ලද බවත්, එහිදී 2021.12. 31 දින වන විට ඉදිකිරීම් අවසන් කර තිබූ කොටස් සඳහා ගෙවීම් සිදුකරන ලද බවත්, මීට අදාළ ඉතිරි වැඩ අවසන් කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන මේ වන විටත් ඉල්ලුම් කර ඇති අතර, එම ප්‍රතිපාදන ලැබුනු විගස | ප්‍රතිපාදන කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝගී කර ව්‍යාපෘතියේ වැඩ අවසන් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කොටසක් පමණක් ඉදිකර තිබුණු අතර, ව්‍යාපෘතිය අතරමග නවතා දමා තිබුණු බව නිරීක්ෂණය විය. | නැවත වැඩ ආරම්භ කර නියමිත පරිදි පූර්ණ ප්‍රතිලාභ අත්කර දීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වා ඇත. | |
| (ආ) | හාරිස්පත්තුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ වැඩ වටිනාකම රු.1,950,000 ක සෙනරත්ගම සාම මාවතේ ඇළ වේල්ල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ 2022 පෙබරවාරි 10 දින වන විට ඉටුකළ යුතු වැඩවලින් සියයට 02 සිට සියයට 50 අතර පරාසයක, එකතුව රු.1,236,146 ක වැඩ කොටස් ඉටු නොකර ව්‍යාපෘතිය අත්හැර දමා තිබුණි. | -එම- | -එම- |

**3.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

---------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | ---------------------- | --------------- |
| ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාර වැඩසටහන යටතේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ තුළ පිහිටි වසම්වල පිහිටුවා තිබුණු ග්‍රාම ශක්ති ජනතා සමිති සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුණින් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 09 ක වසම් 23 ක සමිතිවලට රු.10,400,000 ක මුදලක් ලබාදී තිබුණි. එහෙත් 2022 පෙබරවාරි 28 දිනවන විට ඉන් රු.5,226,613 ක් උපයෝජනය කර නොතිබුණි. මෙය ලබාදී තිබුණු මුදලින් සියයට 50 ක් පමණ වන අතර, එම මුදල් ඌන උපයෝජිතව සමිති භාරයේ තබාගෙන තිබුණි. | ප්‍රජාදායකත්වය ලබා ගැනීමේ අපහසුතාවය, ඉඩමේ ඉදිකිරීම් කටයුතු සඳහා එකඟතාවය ලබාදීමේ ප්‍රමාදයක් පැවතීම, සමිති මඟින් යෝජනා ලබා දීමට සිදුවූ ප්‍රමාදයන්, ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය මඟින් මෙම මාර්ගයේ ජලනල එළිමේ කටයුතු සිදුකිරීමට නියමිත වූ බැවින් එම කටයුතු අවසන් වන තෙක් එහි කොන්ක්‍රීට් ඇතිරීම ප්‍රමාද කිරීමට සිදුවීම, ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම, යටිතල පහසුකම් සංවර්ධනය යටතේ ඵලදායි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ජීවනෝපාය සංවර්ධනය කිරීම සඳහා වූ චක්‍රීය අරමුදලට යෙදවීම, රටේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය, අමුද්‍රව්‍ය මිල ඉහළ යාම හා අමුද්‍රව්‍ය හිඟකම වැනි හේතු මත මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | අපේක්ෂිත අරමුණු කරා ළඟා වීමට හැකිවන ආකාරයට ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කළ යුතුය. |

**3.5 රජයේ නිලධාරීන් ඇප තැබීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 1999 අප්‍රේල් 09 දිනැති අංක 1/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 05 ඡේදය හා මුදල් රෙගුලාසි 880 අනුව පූජාපිටිය, ගලගෙදර, හතරලියද්ද, හාරිස්පත්තුව හා අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ නියුතු ඇප තැබිය යුතු නිලධාරීන් 25 දෙනෙකු ඇප මුදල් තැන්පත් කර නොතිබුණි | ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශ චක්‍රලේඛ 04/2022 අනුව කටයුතු කිරීමට සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කර ඇති බව දක්වා ඇත. | මුදල් රෙගුලාසි අනුව ඇප ලබා ගත යුතුය |

**3.6 පාඩු හා හානි**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් 2021 අගෝස්තු 27 දින අනතුරට ලක්වී තිබුණු අතර, මුදල් රෙගුලාසි 104(3) යටතේ අලාභයන් පිළිබඳ ප්‍රාරම්භක වාර්තාව අනුව ඇස්තමේන්තුගත අලාභය රු.2,291,483 ක් වී තිබුණි. විගණිත දින වූ 2022 මාර්තු 25 වන විටද මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාර පරික්ෂණය සිදුකර අලාභය සඳහා වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන නොතිබුණු අතර, අලාභය මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් අංක CPPA - 4933 දරන සංචිත වාහනයේ මු.රෙ. 104 (4) ප්‍රකාර අවසාන පරීක්ෂණ කටයුතු නිම කර නොතිබූ අතර ඒ හේතුවෙන් හානියේ වටිනාකම නිශ්චිතව ප්‍රකාශ වී නොමැති නිසා මූල්‍ය ප්‍රකාශනයේ හානි පාඩු යටතේ ඉදිරිපත් කර නොමැති බව දක්වා ඇත. | අනතුරක් සිදු වූ වහාම අදාළ පරික්ෂාවන් කඩිනමින් සිදුකර වගකිව යුත්තන්ගෙන් අලාභය අයකර ගැනීමට හා ලේඛන ගත කිරීමට ක්‍රියා කල යුතුය. |

## 3.7 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක විශ්‍රාමික නිලධාරීන් 61 දෙනෙකු වෙත එකතුව රු.13,219,853 ක විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවා, පසුව ඔවුන්ගෙන් වාරික වශයෙන් රු.8,034,295 ක් අයකර තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දින වන විට තවදුරටත් රු.5,185,558 ක් අයකරගත යුතුව පැවතුණි. | හමුදා දුබලතා විශ්‍රාම වැටුප් හිමි විශ්‍රාමිකයන්ගේ දුබලතා විශ්‍රාම වැටුප හා සේවා විශ්‍රාම වැටුප ඒකාබද්ධ කර ගෙවීමේදී පෙර ගෙවන ලද දුබලතා විශ්‍රාම වැටුප අඩු වූ බවත්, ඒ හේතුවෙන් මෙම වැඩිපුර ගෙවීම සිදුව ඇති බවත්, මේ වන විට ඉන් රු.8,034,295 ක් අයකර ගෙන ඇති බවත්, ඉතිරි මුදල අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව දක්වා ඇත. | වැඩිපුර ගෙවන ලද ගෙවීම් අයකර ගැනීමටත්, මෙවැනි සිදුවීම් වැලැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාම නිලධාරී වසම් 03 ක ග්‍රාම ශක්ති ව්‍යාපාරය යටතේ 2021 දෙසැම්බර් 31 දිනට ලබාදුන් ණයවලින් තවදුරටත් රු.3,027,679 ක ශේෂයක් අයවීමට පැවති අතර, අඛණ්ඩව මාස 06 කට වඩා ගෙවා නොමැති ණය ශේෂය රු.2,442,820 ක් වී තිබුණි. මෙම ණය අයකර ගැනීම සම්බන්ධයෙන් ජනාධිපති ලේකම් කාර්යාලය මගින් නිකුත් කළ ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය මාර්ගෝපදේශයේ 6 පරිච්ඡේදය මගින් නිලධාරීන්ට පවරා තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2017 ග්‍රාම ශක්ති ජනතා සමිති පිහිටුවා සමාගම් මැදූරේ ලියාපදිංචි කර සියලු ණය ගණුදෙණු පිළිබඳ ලිඛිත වාර්තා තබා ගැනීම හා ණය අයකර ගැනීම අදාළ සමිතිවල වගකීමක් වන අතර, ග්‍රාම ශක්ති ව්‍යාපාරයේ ආරම්භක කටයුතුවලට සහය වීම හා ක්‍රියාත්මක කර නිසි ආකාරයෙන් පවත්වා ගෙන යන්නේද යන්න පිළිබඳ අධීක්ෂණය කිරීම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් විසින් සිදුකරනු ලබන බවත්, තවද සමිතිවල අය කර ගැනීමට කල්පසු වූ ණය අයකර ගැනීමට මුලාරම්භයක් ලෙස, ණය නොගෙවූ පුද්ගලයන්ට ලිපියක් මගින් ණය ගෙවන ලෙස දන්වා යවා ඇත. | අදාළ ණය මුදල් අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |

**4.** **යහපාලනය**

---------------

**මහජනයා වෙත සේවා ඉටු කිරීම**

------------------------------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මහනුවර දිස්ත්‍රික්කයේ දිවිනැගුම ප්‍රජාමූල බැංකුවලට අදාළව 2021 දෙසැම්බර් 31 දින වන විට ජීවනෝපාය චක්‍රීය අරමුදල් ගිණුමේ ශේෂ එකතුව රු.173,690,665 ක් වූ අතර, ඉන් සමාලෝචිත වර්ෂය වන විට ලබාදුන් මුළු ණය ශේෂයෙන් හිඟහිටි ශේෂය රු.78,754,685 ක් වී තිබුණි. අඩු ආදායම් ලාභීන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා ව්‍යාපෘතිය තුළින් ඔවුන් බලගැන්වීමේ අරමුණින් ලබාදෙන ණය වැඩසටහනෙහි රු.94,935,980 ක හෙවත් සියයට 55 කට අධික ප්‍රමාණයක් තවදුරටත් ණය ලෙස ලබාදීමට හැකියාව තිබියදී අපේක්ෂිත අරමුණු ඉටුවන ආකාරයට කටයුතු කර නොතිබුණි. | කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් බිඳ වැටුණු ව්‍යවසායකයින් ණය ආපසු ගෙවීමේ දුර්වල මට්ටමක් පැවතීම මත තව දුරටත් ණය නිකුත් කිරීම ගැටළුවක් වීම. ප්‍රජාමූල බැංකු මගින් එක් ප්‍රතිලාභියෙක් වෙත ණය වර්ග කිහිපයක් නිකුත් කර තිබීම මත ආපසු අය කර ගැනීමේ හැකියාව සැලකිල්ලට ගැනීම. ප්‍රජාමූල බැංකු මගින් ක්‍රියාත්මක කරන සමස්ථ ණය වැඩ සටහන මෙන්ම අනෙකුත් මූල්‍ය කටයුතු තැන්පතු ආපසු ගැනීම්වලට යොමුවන පරිදි ප්‍රතිලාභින්ගේ ජීවන මට්ටම පහළ මට්ටමක පැවති බව දක්වා ඇත. | හිඟ ණය මුදල් අයකර ගැනීමට වැඩපිළිවෙලක් ස්ථාපිත කළ යුතු අතර, ණය ලබාදීම වැඩි කිරීම තුළින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන (අතිවිශේෂ) ගැසට් පත්‍රයේ පළකර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීති (කාණ්ඩ අංක 01) හි xviii පරිච්ඡේදයේ රාජ්‍ය නිලධරයන්ගේ ස්ථාන මාරුවීම් සම්බන්ධව විධිවිධාන හා 2001 අගෝස්තු 22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2001, අනුව රාජ්‍ය නිලධාරීන් වර්ෂ | දුෂ්කර සේවා ස්ථාන ලෙස සලකනු ලබන හතරලියද්ද, හසලක, උඩුදුම්බර, දෙල්තොට, මිනිපේ වැනි කාර්යාලවල නිලධාරීන්ගේ හිඟය හේතුවෙන් ඔවුන් ඉල්ලා නොසිටින අවස්ථාවලදී රාජකාරී අවශ්‍යතාවය මත නිලධාරීන් රඳවා ගැනීමට කටයුතු කරන බව දන්වමි. | චක්‍රලේඛ විධිවිධාන අනුව රාජ්‍ය නිලධාරීන් සඳහා ස්ථාන මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 05 කින් ස්ථාන මාරුවිය යුතු වුවද, පූජාපිටිය අකුරණ, මැදදුම්බර, හාරිස්පත්තුව, හතරලියද්ද යන ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල අවුරුදු 05 ත් 22 ත් අතර කාලයක් පිළිවෙළින් නිලධාරීන් 21, 20, 09, 15 ක් හා 19 ක් එකම කාර්යාලයේ සේවය කරන බව නිරීක්ෂණය විය. | | |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල 20 හි ජ්‍යේෂ්ඨ මට්ටමේ 19 ක්, තෘතියික මට්ටමේ 39 ක්, ද්විතියික මට්ටමේ 241 ක් හා ප්‍රාථමික මට්ටමේ 34 ක් ඇතුළුව තනතුරු 333 ක පුරප්පාඩු පැවතුණි. | තනතුරු පුරප්පාඩු පිළිබඳව විස්තර වාර්තා ත්‍රෛමාසිකව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු අතර, රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබන බඳවාගැනීම් අනුව එම පුරප්පාඩු පිරවීම සිදු කරනු ලබන බව දක්වා ඇත. | පුරප්පාඩු පුරවා සේවාවන් නිසි පරිදි පවත්වා ගෙන යාමට ක්‍රියා කළ යුතුය. |